# XXV වැනි පරිච්ඡේදය

## නීති උපදෙස් සහ නීතිමය ක්‍රියාමාර්ග

1. නීති උපදෙස්

2. නීතිමය ක්‍රියාමාර්ග

# XXV වැනි පරිච්ඡේදය

## නීති උපදෙස් සහ නීතිමය ක්‍රියාමාර්ග

1. **නීති උපදෙස්**

1.1 කොමිෂන් සභාව සහ සෑම උසස් අධ්‍යාපන ආයතනයක් ම/ විද්‍යායතනයක් ම තම ආයතනයට අදාල නීති කටයුතු ඉටු කිරීම සඳහා, නීතිඥයකු (Attorney-at-law) සිය කාර්ය මණ්ඩලයෙහි නීති නිලධාරි තනතුරෙහි සේවය සඳහා බඳවා ගත යුතු වේ. — නීති නිලධාරී තනතුර

1.2 විශ්වවිද්‍යාල පනත හෝ වෙනත් ඕනෑම නියමයක් හෝ නියමාවලියක්, රීතියක් ආදී මෙහි අන්තර්ගත කරුණක් මෙන් ම, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක පරිපාලනයට සම්බන්ධ කුමන හෝ කරුණක් සහ විනයානුකූල ක්‍රියාමාර්ග සම්බන්ධ කරුණක් පැන නැගී ඇති ඕනෑම අවස්ථාවක දී සහ ඒ පිළිබඳව නීති උපදෙස් හෝ මතයක් ලබා ගැනීම උචිත යැයි හැගෙන අවස්ථාවක දී නීතිපතිවරයා හෝ පුද්ගලික නීතිඥයකු අවශ්‍ය පරිදි නීති උපදෙස් ලබා ගැනීම සඳහා විමසීම කළ යුතු ය. — නීතිපතියවරයාගේ හෝ පෞද්ගලික නීතිඥවරයකුගේ මතය විමසීම

1.3 කුමන හෝ කරුණක් සම්බන්ධයෙන් පෞද්ගලික නීතිඥ මණ්ඩලයක, ජ්‍යෙෂ්ඨ නීතිඥවරයකුගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය වූ විට, කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනය/ විද්‍යායතනය විසින්, ඒ සඳහා නීතිපතිවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වේ. — පෞද්ගලික සහ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයකුගේ සේවය ලබා ගැනීම

1.4 නීතිපතිවරයාගේ/ පෞද්ගලික නීතිඥවරයකුගේ උපදෙස් අපේක්ෂා කරනු ලබන්නේ කුමන කරුණක් සම්බන්ධයෙන් ද යන්න ගැන, ඒ සම්බන්ධයෙන් පිළියෙල කරනු ලබන සංදේශයෙහි (Memorandum) පැහැදිලිව සඳහන් කළ යුතු ය. එම සංදේශයෙහි, කරුණට අදාල සියලුම තොරතුරු සම්පූර්ණයෙන් සහ විධිමත්ව ඇතුලත් කළ යුතු වේ. අවශ්‍ය අවස්ථාවන්හි දී එම සංදේශයෙහි පිටපත් ද අවශ්‍ය පරිදි ලබා ගත යුතු ය. උපදෙස් විමසන කරුණට අදාල ලිපිගොනු නීතිපතිවරයාට හෝ පෞද්ගලික නීතිඥවරයාට අවශ්‍ය වන විට, එම ලිපි ගොනු නිසි පරිදි පිටු අංක යොදා මාණ්ඩලික නිලධරයකු විසින් පරීක්ෂා කොට බලා අදාල පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ/ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයාගේ ප්‍රකාශිත අවසරය පිට, අවශ්‍ය නිලධරයාට ලබා දිය යුතු අතර, එම ලිපිගොනු අදාල කාරණය අවසන් වූ පසු වහාම නැවත ආයතනයට ලබා ගැනීමට ද කටයුතු කළ යුතු ය. — නීතිපතිවරයාට/ නීතිඥයින්ට අවශ්‍ය විස්තර සැපයීම

1.5 හුදෙක් කල්පිත කරුණු මත, නීතිපතිවරයාගේ හෝ පෞද්ගලික නීතිඥවරයකුගේ නීති උපදෙස් ලබා ගැනීම නොකළ යුතු ය. — කල්පිත කරුණු සඳහා නොවේ

1.6 කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක පාලක බල මණ්ඩලයක අවසරය ලැබී නොමැති, කිසිදු කොන්ත්‍රාත් ගිවිසුමක කෙටුම්පතක්, බදු ඔප්පුවක් හෝ වෙනත් ඔප්පුවක කෙටුම්පතක් ආදී ලේඛනයක කෙටුම්පතක් සකස් කර දෙන ලෙස ඉල්ලා නො සිටිය යුතු ය. එවැනි අවසරයක් — කොන්ත්‍රාත්, බදු ඔප්පු, වෙනත් ඔප්පු කෙටුම්පත්

ලැබී ඇති අවස්ථාවන්හි දී, කොමිෂන් සභාව විසින්/ උසස් අධ්‍යාපන ආයතනය/ විද්‍යායතනය විසින් අනුමත කළ නියමයන් සහ කොන්දේසි නීතිපතිවරයාට/ පෞද්ගලික නීතිඥවරයාට ලබා දිය යුතු ය.

1.7 කොමිෂන් සභාව විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක පාලක බල මණ්ඩලය විසින් හෝ අවස්ථාවෝචිත පරිදි, යම් නිශ්චල දේපළක් අයිති කර ගැනීමට ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ වී ඇත්නම් මිස සහ එම දේපළ අත්පත් කර ගැනීමට අවශ්‍ය මුදල් තිබේ නම් ද මිස, අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වන දේපළ වල මුල් ඔප්පු පරීක්ෂා කිරීමට හෝ ඒ ගැන වාර්තාවක් සැපයීමට නීතිපතිවරයාගෙන් හෝ පෞද්ගලික නීතිඥවරයාගෙන් ඉල්ලා නොසිටිය යුතු ය.

*නිශ්චල දේපළ සම්බන්ධයෙන්*

1.8 දුෂ්කර අවස්ථාවන්හි දී, නීතිපතිවරයාගේ හෝ පෞද්ගලික නීතිඥවරයකුගේ නීති සහය ලබා ගැනීමට කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින්/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා විසින් බලය ලබා දී ඇත්නම් මිස, විනය පරීක්ෂණයක චූදිත තැනැත්තාට විරුද්ධව චෝදනා පත්‍රයක් සකස් කරන ලෙසට ඉල්ලා නො සිටිය යුතු ය. එවැනි අවස්ථාවල දී, මූලික විමර්ශන වාර්තාව සහ එහි අඩංගු වෙනත් ලියවිලි වල පිටපත් පමණක් නීතිපතිවරයාට හෝ පෞද්ගලික නීතිඥවරයාට ලැබීමට සැලැස්විය යුතු ය.

*නීත්‍යානුකූල ක්‍රියාමාර්ග තුල චෝදනා ගොනු කිරීම*

1.9 නීතිපතිවරයා විසින් හෝ පෞද්ගලික තත්ත්වයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයකු විසින් හෝ ලබා දුන් නීති උපදෙස් වෙනත් කිසිදු පාර්ශවයක් වෙත දැන්වීම නොකළ යුතු ය. එසේ ලබා දුන් උපදෙස් රහස්‍ය කරුණු සේ සැලකිය යුතු අතර, එකී උපදෙස් මත ක්‍රියාත්මක කළ තීරණය පමණක් අදාල පරිදි දැනුම් දිය යුතු වේ.

*නීති උපදෙස් කිසිදු පාර්ශවයකට දැනුම් නොදිය යුතු ය*

## 2. නීතිමය ක්‍රියාමාර්ග

2.1 කොමිෂන් සභාව/ විශ්වවිද්‍යාලයක්/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක්/ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක්, නීත්‍යානුකූලව පිහිටුවා තිබේ නම්, එම ආයතනය නමින් යම් කරුණක් අරබයා නඩු පැවරිය හැකි අතර, එම ආයතනයන්ට විරුද්ධව නඩු පැවරීමට ද හැකියාව තිබේ. [පනතෙහි 2 (2) (a), 28 (1) (a) සහ 54 (1) සහ යම් උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් පිහිටුවීමේ නියමාවලියෙහි අදාල ඡේදයෙහි අඩංගු ප්‍රතිපාදනයන්ට අනුව]

*පොදු බලය*

2.2 කොමිෂන් සභාව විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක පාලක බල මණ්ඩලය විසින්, ඉහත 2.1 උප ඡේදයෙහි සඳහන් පොදු බලය කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනය/ විද්‍යායතනය විෂයයෙහි ක්‍රියාත්මක කරනු ඇත.

*බලය ක්‍රියාත්මක කිරීම*

2.3 යම් තැනැත්තෙකු විසින් ගනු ලැබ ඇති නීතිමය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන්, වග උත්තරකාර පාර්ශවය ලෙස ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කොමිෂන් සභාවට/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක පාලක බල මණ්ඩලයට දැනුම් දීම කළ යුතු වේ.

*වග උත්තරකාර පාර්ශවයේ ක්‍රියාමාර්ග දැනුම් දීම*

2.4 කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින්/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා විසින් පත්කරන ලද නීති නිලධරයෙකු හෝ වෙනත් නිලධරයෙකු ද,

*පෙනීසිටීම් තහවුරු කිරීම සඳහා*

නීතිමය කටයුතු වලට සම්බන්ධ සියලුම කටයුතු ඉටු කිරීම සඳහා සහ නඩු විභාග කරන දිනයන් සහ අදාල ක්‍රියාමාර්ග ගැන දැනුවත්ව සිටීම සඳහා යොදවා සිටිය යුතු ය. එමෙන්ම;

(අ) ආයතනය වෙනුවෙන් පෙනී සිටීමට පත් කොට ඇති නීතිඥවරයා අදාල අවස්ථාවන් හි දී පෙනී සිටින බවට වග බලා ගැනීම සඳහා;

(ආ) ආයතනය වෙනුවෙන් ඉල්ලීම් (Motions), පිළිතුරු (Answers) සහ දිවුරුම් ප්‍රකාශ (Affidavits) ආදිය ගොනු කිරීමට;

(ඇ) අදාල නීතිමය ක්‍රියාමාර්ග සම්බන්ධ සියලුම ලේඛන, ලිපි ආදිය ගොනු කිරීමට;

(ඈ) අවශ්‍යතාවයට අනුව, උසාවියට ඉල්ලුම්පත් යොමු කිරීමට;

(ඉ) නඩු විභාගයට සම්බන්ධ වීමට;

(ඊ) සුදුසු පරිදි නඩු ගාස්තු හෝ අලාභ ගෙවා දැමීමට හෝ අයකර ගැනීමට;

(උ) නීතිමය කටයුතු වලට අදාල වෙනත් ඕනෑම කටයුත්තක් ඉටු කිරීමට,

එම නීති නිලධරයා හෝ වෙනත් නිලධරයකු වගකිව යුතු වේ.

2.5 යම් නීතිමය කටයුත්තක දී, වියදම්/අලාභය හෝ වෙනත් ගෙවීම් අයකර ගත යුතුව ඇති විට හෝ ආයතනය විසින් එවැනි ගෙවීම් සිදු කිරීමට ඇත්නම්, එම කරුණ අධිකරණය ඉදිරියේ දී නිරාකරණය කර ගැනීමට පෙර, අදාල පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාගෙන්/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධාරියාගෙන් විමසා අනුමැතිය ලබා ගත යුතු බවට, නීතිඥවරයාට හෝ වෙනත් අදාල නිලධාරියකු හට උපදෙස් දිය යුතු ය. *අලාභ/ වියදම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම*

2.5.1 කෙසේ වුවද, අධිකරණයේ දී සමථයකට එළඹීම ආයතනයට වාසිදායක වන අවස්ථාවන්හි දී, නීතිපතිවරයා විසින්, පෞද්ගලික නීතිඥවරයා විසින්, අදාල පරිදි කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනය/ විද්‍යායතනය විමසා, එසේ අධිකරණයේ දී සමථයට එළඹීම සිදු කිරීමට හැකියාව තිබේ. *සමථයට එළඹීම*

2.6 කම්කරු විනිශ්චය සභාවක විභාග වන සියලුම කරුණුවල දී, ආයතනයේ නීති නිලධරයා/ නීතිපතිවරයා/ පෞද්ගලික නීතිඥවරයකු හට කොමිෂන් සභාව වෙනුවෙන්/ උසස් අධ්‍යාපන ආයතනය/ විද්‍යායතනය වෙනුවෙන් පෙනී සිටිය හැකි අතර, එම කරුණු වලදී ද, මෙම ඡේදයෙහි සඳහන් නියමයන්, "*අවශ්‍ය පරිදි වෙනස් කිරීමට යටත්ව*" අනුගමනය කළ හැකිය. *කම්කරු විනිශ්චය සභා*

2.7 මණ්ඩප සහ ආයතනයන් හි නීති උපදෙස් සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වන අවස්ථාවන්හි දී, එම කරුණු අදාල පරිදි එම මණ්ඩප සහ ආයතන අනුබද්ධව/ අනුයුක්තව පවතින අදාල විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත යොමු කළ යුතු වේ. *මණ්ඩප/ ආයතනයන්හි නීති කටයුතු*